# Centrelink කාර්යාලය සහ ගෘහස්ථ සම්මුඛ සාකච්ඡාවන්



We speak your language ☎ 13 1202

*Centrelink Office and Home Interviews* - **Sinhalese**

ඔස්ට්‍රේලියානු රාජ්‍ය දෙපාර්තමේන්තු ගණනාවක් වෙනුවෙන් ඔස්ට්‍රේලියානු ප්‍රජාව සඳහා ගෙවීම් සහ සේවාවන් Centrelink සලසයි.

පාරිභෝගිකයන් ඔවුනගේ නියමාකාර ගෙවීම් ලබාගනී දැයි සහතික වශයෙන් දැනගැනීම සඳහා Centrelink අනිවාර්යයෙන්ම පාරිභෝගිකයන් ගෙන් තොරතුරු දැන තිබිය යුතුවේ. සම්මුඛ සාකච්ඡාවක් යනු මෙකී තොරතුරු එක්රැස් කිරීමේ පොදු මාර්ගය වේ.

## සම්මුඛ සාකච්ඡාවේදී ඔබේ අයිතීන්

සම්මුඛ සාකච්ඡාව ආරම්භයේදී, Centrelink නිලධාරියකු සම්මුඛ සාකච්ඡාවට හේතුව පැහැදිලි කරනු ඇත.

ඔබට යම් පැනයක් නොවැටහේ නම් හෝ Centrelink නිලධාරියා එකී පැනය ඔබෙන් විමසන හේතුව ඔබට නොවැටහේ නම්, එය පැහැදිලි කර දෙන ලෙසට ඉල්ලා සිටිය හැක. ඔබේ ගෙවීම් සම්බන්ධව අදාල නොවේ නම් යම් පැනයකට පිළිතුරු දීම අවශ්‍ය නොවේ.

ඔබ පවසන යමක් ඔබට විරුද්ධව නීති මාර්ගයකට තුඩුදේ යැයි ඔබ සිතයි නම්, පිළිතුරු දීමෙන් වැලකී සිටිය හැක. ඕනෑම අවස්ථාවක ඔබට සම්මුඛ සාකච්ඡාව අවසන් කල හැක.

## සම්මුඛ සාකච්ඡාව අවස්ථාවේදී ඔබේ වගකීම්

- නියම කරගත් ඉඩ ප්‍රස්ථාව සඳහා පැමිණිය නොහැකි නම් එය අපට දැනුම් දෙන්න.
- සම්මුඛ සාකච්ඡාව සඳහා අදාල තොරතුරු සූදානම් කොට තබා ගන්න.
- ඔබේ තත්වයට අදාල යමක් වෙනස් වේ නම් අපට වහා දැනුම් දිය යුතුය, උදාහරණ ලෙස, ඔබේ ලිපිනය වෙනස් කලහොත්, රැකියාවක හෝ අධ්‍යාපනයේ නියැලීම ආරම්භ කලහොත්, ඔබේ අදායම වෙනස්වේ නම්, හෝ ඔබ විදෙස් ගත වේ නම්.

ඔබ පිළිබඳ අවශ්‍ය තොරතුරු අප සතුව නොමැති නම් ගෙවීම් නොනවත්වා ලබාදීමට Centrelink හට නොහැකි හෙයින් පැනයන්ට නිවැරදිව පිළිතුරු දීම ඉතා වැදගත්වේ.

ඔබ විසින් අත්සන් කරන ලද යම් පෝරමයක, ප්‍රකාශයක හෝ සම්මුඛ සාකච්ඡාවේදී Centrelink නිලධාරියා විසින් කරන ලද යම් වාර්ථාවක පිටපතක් ඉල්ලා සිටීමට ඔබට හැකිය.

## නිවෙස් පිවිසුම්

සමහර විට Centrelink නිලධාරියකු ඔබේ නිවසට පැමිණීමට ඉඩ ඇත. එය සිදුවනුයේ:

- ඔබ අබාධිත හෝ රෝගී තත්වයක පසුවේ නම්,
- කාර්යාලය වෙත යාමට ඔබට ගැටළු සහගත තත්වයක් ඇති හෙයින් නිවෙස් පිවිසුමක් සඳහා ඔබ ඉල්ලීමක් කළේ නම්,
- ඔබ නිවැරදි ප්‍රමාණය ලබන බවට සහතික වනු වස් ඔබේ ගෙවීම් සංශෝධනය කිරීමට, **හෝ**
- ඔබ වැරදි ලෙස ගෙවීම් ලැබූ බව අප සිතයි නම්.

පැමිණෙන අවස්ථාවේදී Centrelink කාර්ය මණ්ඩලය ඔවුනගේ හැඳුනුම් පත ඔබට පෙන්විය යුතු අතර එය සැමවිටම පැළඳ සිටිය යුතුය. ඔවුනගේ හැඳුනුම්පත් වල ඔවුනගේ ඡායාරූපයන් සහ සම්පූර්ණ නම් සඳහන් වනු ඇත. ඔබේ අනුමැතිය නොමැතිව Centrelink කාර්ය මණ්ඩලයට ඔබේ නිවසට ඇතුළු විය නොහැකි අතර ඔබට ඕනෑම අවස්ථාවක ඔවුනට පිටවන ලෙස ඉල්ලා සිටිය හැක.

ඉංග්‍රීසි ඔබගේ කැමතිම බස නොවේ නම්, සම්මුඛ සාකච්ඡාව සඳහා භාෂණ පරිවර්තකයකුගේ සහය ලබාදෙන ලෙසට ඔබට Centrelink නිලධාරියාගෙන් ඉල්ලා සිටිය හැක. මෙකී සේවාව සඳහා අය කිරීමක් නොමැත.

සිංහල භාෂාවෙන් වැඩිපුර විස්තර සඳහා දුරකථන අංක **13 1202*** අමතන්න. **www.centrelink.gov.au** හි ඇති අන්තර්ජාලය වෙබ් අඩවිය.

* *අංක 13 න් පටන් ගන්නා දුරකථන අංක සඳහා ඔස්ට්‍රේලියාව තුල වැය වනුයේ ශත 25කි. 1800 න් පටන් ගන්නා අංක සඳහා මුදල් අය නොකෙරේ. පොදු දුරකථන සහ ජංගම දුරකථන වලින් කෙරෙන ඇමතුම සඳහා වැඩි මුදලක් අයකරනු ඇත.*